කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2022 අප්‍රේල් මස 13 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 අප්‍රේල් මස 13 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**පහළ වායුගෝලයේ පැවති කැළඹිලි ස්වභාවය දිවයිනෙන් ඉවතට ගමන් කරමින් පවතී.**

බස්නාහිර, සබරගමුව සහ දකුණු පළාත්වල විටින් විට වැසි ඇතිවේ.

සෙසු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. නැගෙනහිර, ඌව, උතුරු-මැද සහ උතුරු පළාත්වල ඇතැම් ස්ථාන වලට **මි.මී. 75**ට වැඩි තරමක් තද වැසි ඇතිවිය හැක.

සෙසු ප්‍රදේශවලද ඇතැම් ස්ථාන වලට **මි.මී. 50** ට වැඩි තරමක් තද වැසි ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

දෘශ්‍ය ලෙස සූර්යයා උතුරට ගමන් කිරීමේදී සූර්යයා, අප්‍රේල් මස 05 සිට 15 දක්වා දිනවලදී ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්ෂාංශ වලට සෘජුවම ඉහලින් පවතී. අද දින (13) දහවල් 12:11 ට තායිලියන්කුඩිඉරිප්පු (මන්නාරම දිස්ත්‍රික්කය), කනකරායන්කුලම්, නෙඩුන්කේනි (වව්නියා දිස්ත්‍රික්කය) සහ නඩ්ඩියන්කන්ඩාල් (මුලතිව් දිස්ත්‍රික්කය) යන ප්‍රදේශ වලට හිරු මුදුන් වනු ඇත.

**WEATHER FORECAST FOR 13 APRIL 2022**
**Issued at 05.30 a.m. on 13 APRIL 2022**

**The low-level atmospheric disturbance in the vicinity of Sri Lanka moving away from the Island.**

Showers will occur at times in Western, Sabaragamuwa and Southern Provinces.

Showers or thundershowers will occur at several places elsewhere during the afternoon or night. Fairly heavy showers **above 75 mm** can be expected at some places in Eastern, Uva, North-central and Northern provinces.
Fairly heavy showers above 50 mm can be expected at some places elsewhere too.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

On the apparent northward relative motion of the sun, it is going to be directly over the latitudes of Sri Lanka from 05$^{th}$ to 15$^{th}$ of April in this year. The nearest areas of Sri Lanka over which the sun is overhead today (13$^{th}$) are Tayliankudiyiruppu (Mannar District), Kanakarayankulam, Nedunkeni (Vauniya District) and Naddiankandal (Mullattivu District) at about 12:11 noon.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය**

# WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

## ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
**2022 අප්‍රේල් මස 13 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. කන්කසන්තුරය සිට මන්නාරම, පුත්තලම, ගාල්ල, මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තද වැසි ද ඇතිවිය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එයි. සුළඟේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ. කන්කසන්තුරය සිට මන්නාරම දක්වාත් හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකලපුව දක්වාත් වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී.** (35-40) දක්වා වැඩිවිය හැක.

**මුහුදේ ස්වභාවය:**

කන්කසන්තුරය සිට මන්නාරම දක්වාත් හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකලපුව දක්වාත් වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ. සෙසු මුහුදු ප්‍රදේශ මඳ වශයෙන් රළු වේ.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
**Issued at 05.30 a.m. on 13 April 2022**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas around the island. Heavy showers can be expected at some places in the sea areas off the coast extending from Kankasanturai to Pottuvil via Mannar, Puttalam, Galle, Matara and Hambantota.

**Winds:**

Winds will be south-westerly and wind speed will be (20-30) kmph. Winds speed can increase up to **(35-40) kmph** at times in the sea areas off the coast extending from Kankasanturai to Mannar and Hambantota to Batticaloa via Pottuvil.

**State of Sea:**

The sea areas off the coast extending from Kankasanturai to Mannar and Hambantota to Batticaloa via Pottuvil will be fairly rough at times. The other sea areas around the island will be moderate.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි